මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
நிதி, பொருளாதார அபிவிருத்தி, கொள்கை வகுத்தல், திட்டமிடல் மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC DEVELOPMENT, POLICY FORMULATION, PLANNING AND TOURISM

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.10.04

## මාධ්‍ය නිවේදනය

### නිල ණය හිමි කමිටුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ උපදේශනාත්මක සාකච්ඡා සාර්ථකව නිම කළ බව ශ්‍රී ලංකාව නිවේදනය කරයි

**ඔක්තෝම්බර් මස 04 වන දින කොළඹ:** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, 2024 වසරේ සැප්තැම්බර් මස 19 වැනි දින, සිය ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි ජාත්‍යන්තර සහ දේශීය දරන්නන්ගේ නියෝජිතයන් සමඟ ප්‍රතිපත්තිමය ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව, මේ වන විට ශ්‍රී ලංකා බලධාරීන් මෙම ප්‍රතිපත්තිමය ගිවිසුමේ කොන්දේසි, අදාළ සියළු පාර්ශවයන්ට සාධාරණ වේ ද යන්න සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලැබෙන වැඩසටහනේ පරාමිතීන් සමඟ අනුකූල වේ ද යන්න පිළිබඳව, ශ්‍රී ලංකාවේ නිල ණයහිමි කමිටුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පැවැති උපදේශනාත්මක සාකච්ඡා සාර්ථකව අවසන් කර ඇත.

මූලික වශයෙන් එළැඹි ගිවිසුමෙහි පවතින කොන්දේසි ණය සඳහා විසඳුම් සෙවීමේ සංසන්දනාත්මක මූලධර්මයට අනුකූල බව නිල ණය හිමි කමිටුව විසින් විධිමත් ලෙස තහවුරු කර ඇති බව ශ්‍රී ලංකාව සතුටින් වාර්තා කරනු ලබයි. ඒ හා සමගාමීව, 2024 වසරේ ජූනි මාසයේ දී නිල ණය හිමි කමිටුව සහ චීන එක්සිම් බැංකුව සමඟ එකඟ වූ නියමයන්ට අනුකූලව නිල ණය හිමිකම් ප්‍රතිව්‍යුහගත කිරීම සමඟින් සලකා බලන විට, මූලික වශයෙන් එළැඹි ගිවිසුමේ නියමයන් විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි දෙවන සමාලෝචන සාර්ව රාමුව යටතේ වන වැඩසටහන් පරාමිතීන් සපුරාලන බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යමණ්ඩලයෙන් තහවුරු කිරීමක් ද බලධාරීන් හට ලැබී ඇත.

සැප්තැම්බර් මස 21 වන සෙනසුරාදා ශ්‍රී ලංකාවේ පැවැති ජනාධිපතිවරණයෙන් පසු, සැප්තැම්බර් මස 25 වන දින නව රජය බලයට පත් වීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රජය සැප්තැම්බර් මස 19 වන දින ප්‍රකාශයට පත් කළ පරිදි වැඩසටහනට අදාළ ණය ඉලක්ක සහ මූලික වශයෙන් එළැඹි එකඟතාවයේ කොන්දේසි පිළිගන්නා බවටත්, එම කොන්දේසිවලට අනුකූලව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේ ගනුදෙනුව ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමටත් අනුමැතිය ලබා දී ඇත.

මෙම ක්‍රියාවලිය පුරාවට සද්භාවයෙන් කටයුතු කිරීම සහ අඛණ්ඩ සහයෝගය ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකාව සියලුම ණය හිමියන්ට මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ නිල ණය හිමි කමිටුව වෙත ස්තුතිය පුද කරනු ලබයි.